

# ඕස්ට්‍රේලියාවේදී භාවිතයට අපහසු ඔබගේ නම වෙනස් කරගන්නේ කෙසේද ?

මධු වර්ණකුලසූරිය
සොලිසිටර් සහ බැරිස්ටර් - ඕස්ට්‍රේලියාව
නීතිඥ - ශ්‍රී ලංකාව

ඕස්ට්‍රේලියාව තුල පදිංචි ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනෙකුට බලපාන පොදු ගැටළුවක් නම්, අපට උරුම වී ඇති සහ යොදා ඇති නම් අතිශයින් දීර්ඝ වීමයි.

මුල් නම් සහ වාසගම් වල ඇති දීර්ඝ භාවයත්, දෙමාපියන් විසින් උපතේදී තම දරුවාට නම් කිහිපයක් ලබා දීමත් නිසා ඕස්ට්‍රේලියානු රජයේ සහ පෞද්ගලික ආයතන වල කාර්යාල කටයුතු වලදී බොහෝ ශ්‍රී ලාංකිකයන් අපහසුතාවට පත් වේ.

මෙකී අපහසුතාව පූර්ණ කාලීනව මඟහරවා ගැනීම සඳහා ඔබට අවශ්‍ය නම් ඔබගේ නම කෙටි කර ගැනීමට හෝ වෙනස් කර ගැනීමට ඕස්ට්‍රේලියානු නීතය යටතේ ඔබට හැකියාව ඇත.

ඔබ වයස අවුරුදු 18 ට වැඩි අයෙක් වුවද නො-වුවද, ඒ සඳහා ඔබට අයදුම් කල හැකිය. ඔබට අවශ්‍ය වන්නේ ඔබගේ දරුවාගේ නම වෙනස් කිරීමට නම්, ඔබට දෙමාපියන් ලෙස ඒ සඳහා හැකියාව ඇත. මේ සඳහා අවශ්‍ය මූලික සුදුසුකම වනුයේ ඔබ ඕස්ට්‍රේලියාවේ උපත ලබා තිබීම හෝ ඕස්ට්‍රේලියාව තුල වසරක් හෝ වැඩි කාලයක් පදිංචිව සිටීමයි.

ඔබ ස්ථිර පදිංචිකරුවකු වුවද, තාවකාලික පදිංචි කරුවෙකු වුවද, (ශිෂ්‍ය, ව්‍යාපාරික, දේශ ගවේෂක..... වැනි) ඔබට ඉල්ලුම් කළ හැකිය.

මේ සඳහා අදාල අයදුම්පත ඔබ යොමු කල යුත්තේ "වික්ටෝරියානු උපත්, මරණ සහ විවාහ පිළිබඳ රෙජිස්ට්‍රාර් කාර්යාලය" වෙතයි. නිසියාකාරව පවරන ලද අයදුම්පත්‍රයක් සමඟ අදාල ගාස්තුව එම කාර්යාලය වෙත ලැබීමට සැලැස්වීමෙන් ඔබට වැඩ කරන දින 20ක් ඇතුලත ඔබගේ අවශ්‍යතාව ඉටු කරගත හැකිය. මේ සඳහා අයදුම්පත් ගාස්තුව ඕස්ට්‍රේලියානු ඩොලර් 63.30 ක් වන අතර සහතික පත් ගාස්තුව ඩොලර් 27.80කි.

ඔබට මෙම සේවය කඩිනමින් ලබැ ගැනීමට අවශ්‍ය නම් අමතර ඩොලර් 75.00ක් ගෙවීමෙන් පසු වැඩ කරන දින 5ක් ඇතුලත සහතික පත්‍රය ලබා ගත හැකිය. ඔබගේ අයදුම් පත්‍රය යොමු කිරීමෙන් පසු ඔබට "නව උප්පැන්න සහතික පත්‍රයක්" (ඔබ ඕස්ට්‍රේලියාව තුලදී උපන් අයෙක් නම්) නිකුත් කෙරෙන අතර, ඔබ විදේශයක උපන් අයෙක් නම් ඔබට "නම් වෙනස් කිරීමේ සහතික පත්‍රයක්" ප්‍රධානය කෙරේ.

ඔබගේ නම වෙනස් කිරීමෙන් පසුව, ඔබට අයත් සියළුම කාර්යාලීය, ලේඛන එනම් රියදුරු බලපත්‍රය, ගුවන් ගමන් බලපත්‍රය, බැංකු ගිණුම්, ඡන්ද නාම ලේඛන ආදී සියල්ලේම නම වෙනස් කිරීම දැක්වීම සඳහා අදාල ආයතන වෙත ඒ බව දැනුම් දිය යුතුය. ඒ සඳහා ඔබ නිකුත් කර ඇති සහතික පත්‍රය හෝ එහි සහතික පිටපතක් ඉදිරිපත් කරන්න.

ඔබ ඕස්ට්‍රේලියාව තුල ජීවත් වන තනි මවක්/පියෙ-ක් නම්, ඔබ දරුවාගේ පියා/මවගේ අනුමැතිය නොමැතිව දරුවාගේ නම වෙනස් කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා උසාවි නියෝගය ඉදිරිපත් කිරීමෙන් පසුව අදාල අවශ්‍යතාව ඉටු කරගත හැකිය.

ඔබ ඕස්ට්‍රේලියාව තුල වෙසෙන ශ්‍රී ලාංකික ශිෂ්‍යයෙකු හෝ තාවකාලික පදිංචි කරුවෙකු නම් ඔබට ඇත්තේ ශ්‍රී ලාංකික ගමන් බලපත්‍රයයි. මෙහි සඳහන් ඔබේ නම, අදාල නම වෙනස් කිරීමේ සහතික පත්‍රය අනුව වෙනස් කිරීමටද ඔබට අසීරු කටයුත්තක් නොවේ.

ඒ සඳහා ආගමන විගමන කාර්යාලයෙන් ලබා ගත් "O" පෝරමය පිරවීමෙන් පසුව අදාල අනෙකුත් ලේඛණ ඇතුලත්ව ශ්‍රී ලංකා ආගමන විගමන දෙපාර්තමේනත්ව වෙත යැවූ පසු ඔබගේ එකී අවශ්‍යතාවද සම්පූර්ණ කරගත හැකිය. ■

**සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න**
03 8707 4604
0402 025 516

**email**
sannasanews@gmail.com
ads.sannasa@gmail.com

IMMIGRATION @
IMMIGRATION
LAWYERS

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

Our team of Specialist Lawyers, Barristers and Registered Migration Agents in Melbourne competently assisted many Sri Lankans, South Asians and many other nationalities and Australian Companies in the following areas of Migration matters over 14 years.

General Skill Migration Permanent Residence
General Skill Migration Provisional Residence
Second stage Skilled Regional (Permanent Residence)
State Sponsored Skill Migration
Graduate Skill Temporary visas
Complex Student visas
457 Visas
Employer Nominations (ENS)
Employer Contracts
Negotiations of employer nominations with the Australian Employers
Regional Sponsored Migration Scheme (RSMS)
Skill Assessments
State Sponsorships
TRA cancellations
Criminal Prosecutions on TRA cancellations
Student Visa Cancellations
Permanent residence Cancelations
Appeals to the Migration Review Tribunal (MRT)
Administrative Review Tribunal (AAT)
Business Migration State Sponsorships
Business Migration visas
Spouse & visas
Aged Parent visas
Contributory Parent visas
Resident Return visas
Australian Citizenships

GUSS DESIGN



Our Team:

LAW INSTITUTE OF VICTORIA SPECIALIST ACCREDITATION

Susantha Katugampala LL B (Monash)
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

Michael Gros LL B (Monash)
Consulting Barrister
MARN: 9803398

Al Noveloso
Migration Consultant
MARN: 0849632

Frank Sabelberg LL B (Monash)
Consulting Solicitor
MARN: 0004726

Lindy Noone
Migration Consultant
MARN: 0322507

Sri Lanka
AUSTRALIA GATEWAY
Australian Migration Consultants
Hilton Colombo Towers
200 Union Place Colombo 02
Telephone: +94 11 2300 627
+94 777 347 670

Australia
FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
10, Morrison Place
East Melbourne Victoria 3002
Telephone: +61 3 9650 4557
Interstate Callers: 1300 888 331
Fax: +61 3 9650 4559

E: info@fairfieldslawyers.com Mobile: 0430 699 961 or 0419 863 771

We Deliver Results..